ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
(අධ්‍යාපන අමාත්‍යාංශය)

පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. කළමනාකාර සේවා ගණය

වැටුප් පරිමාණය : MM 1 - 1 2016 රු. 53,175-10x1375-15x1910-95,575/- (මාසික)

(ක. සේ. චක්‍රලේඛ අංක 02/2016 අනුව මෙම වැටුප් ක්‍රමය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, 2017 වර්ෂයේදී ආරම්භක වැටුප රු. 36,654/- ක් හා ගැළපුම් දීමනාව රු. 4114/- ක් වේ. මීට අමතරව රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.)

වයස : අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

01.1 සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය (පුස්තකාල පර්යේෂණ) (පුරප්පාඩු 01)

සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පංති සාමාර්ථයක් සහිතව පුස්තකාල හා විඥාපන විද්‍යා විශේෂ උපාධියක් ලබා තිබීම

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පුස්තකාල ක්ෂේත්‍රයට අදාල පිළිගත් ආයතනයක වසර තුන (03) ක පළපුරුද්ද

   හෝ

2. විශ්වවිද්‍යාලයක ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හා පුස්තකාලයක හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම

   සහ

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පුස්තකාල ක්ෂේත්‍රයට අදාල පිළිගත් ආයතනයක වසර තුන (03) ක පළපුරුද්ද

   (පර්යේෂණ කටයුතු පිළිබඳ කුසලතාවය හා පරිගණක භාවිතය පිළිබඳ හැකියාව ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

01.2 සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය (පුස්තකාල සහයෝගිතා) (පුරප්පාඩු 01)

සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පංති සාමාර්ථයක් සහිතව පුස්තකාල හා විඥාපන විද්‍යා විශේෂ උපාධියක් ලබා තිබීම

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පුස්තකාල ක්ෂේත්‍රයට අදාල පිළිගත් ආයතනයක වසර තුන (03) ක පළපුරුද්ද

   හෝ

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හා පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම

   සහ

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පුස්තකාල ක්ෂේත්‍රයට අදාල පිළිගත් ආයතනයක වසර තුන (03) ක පළපුරුද්ද

   (පුස්තකාල ක්ෂේත්‍රයේ භාෂාන්තර ආයතන සමග කටයුතු කිරීමේ හැකියාව හා පරිගණක භාවිතය පිළිබඳ හැකියාව ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

01.3 සහකාර අධ්‍යක්ෂ ii ශ්‍රේණිය (ක්‍රමෝපාය සැලසුම්) (පුරප්පාඩු 01)

සුදුසුකම්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පංති සාමාර්ථයක් සහිතව රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය විශේෂ උපාධියක් ලබා තිබීම

   සහ

   උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පිළිගත් ආයතනයක ක්‍රමෝපාය සැලසුම් කටයුතු පිළිබඳව වසර තුන (03) ක පළපුරුද්ද

   හෝ

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම

   සහ

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් පුස්තකාලයක / පිළිගත් ආයතනයක ක්‍රමෝපාය සැලසුම් කටයුතු පිළිබඳ වසර තුන (03) ක පළපුරුද්ද

   (පරිගණක භාවිතය පිළිබඳ හැකියා ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

02. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය

වැටුප් පරිමාණය : JM 1 - 1- 2016 රු. 42,600-10x755-18x1,135-70,580/- (මාසික)

(ක. සේ. චක්‍රලේඛ අංක 02/2016 අනුව මෙම වැටුප් ක්‍රමය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, 2017 වර්ෂයේදී ආරම්භක වැටුප රු. 29,355/- ක් හා ගැළපුම් දීමනාව රු. 5275/- ක් වේ. මීට අමතරව රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.)

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

02.1 පද්ධති විශ්ලේෂක ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව විශේෂවේදී උපාධියක් ලබා තිබීම

සහ

රජයේ අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිත් ආයතනයක පරිගණක වැඩසටහන් සම්පාදනය / විශ්ලේෂණය කිරීම පිළිබඳ වසර එක (01) ක පළපුරුද්ද

02.2 සංරක්ෂණ නිලධාරි ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක රසායන විද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම

සහ

රජයේ අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිත් ආයතනයක ලේඛන සංරක්ෂණ කටයුතු පිළිබඳ වසර එක (01) ක පළපුරුද්ද

02.3 පුහුණු කිරීමේ නිලධාරි ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල හා විඥාපන විද්‍යා / සමාජ විද්‍යා / මානෝ විද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම

සහ

රජයේ අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිත් ආයතනයක පුහුණු කිරීමේ කටයුතු පිළිබඳ වසර එක (01) නපළපුරුද්ද

02.4 පර්යේෂණ නිලධාරි ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල හා විඥපන විද්‍යා / ප්‍රජා විද්‍යා / මානෝ විද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම

සහ

රජයේ අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිත් ආයතනයක සමාජ පර්යේෂණ කටයුතු පිළිබඳ වසර එක (01) ක පළපුරුද්ද

02.5 ව්‍යාප්ති නිලධාරි ii ශ්‍රේණිය (පුරප්පාඩු 01)

සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල හා විඥපන විද්‍යා විශේෂවේදී උපාධියක් ලබා තිබීම

සහ

රජයේ අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිත් ආයතනයක ව්‍යාප්ති කටයුතු පිළිබඳ වසර එක (01) ක පළපුරුද්ද

(ඉහත අංක 02.1 සිට 02.5 දක්වා වූ සියලු තනතුරු සඳහා පරිගණක භාවිතය පිළිබඳ හැකියාව හා ඉංග්‍රීසි භාෂා හැකියාව තිබිය යුතුය.)

03. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය

වැටුප් පරිමාණය : MA 2 - 1 - 2016 රු. 30,310-10x300-07x350-04x495-20x660-50,940/- (මාසික)

(ක. සේ. චක්‍රලේඛ අංක 02/2016 අනුව මෙම වැටුප් ක්‍රමය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, 2017 වර්ෂයේදී ආරම්භක වැටුප රු. 20890/- ක් හා ගැළපුම් දීමනාව රු. 6,662/-ක් වේ. මීට අමතරව රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.)

වයස : අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03.1 කොරතුරු සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 05)

සුදුසුකම්

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i සිංහල / දෙමළ භාෂාව

ii ගණිතය

සහ

iii තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන ඩිප්ලෝමාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

(ඇ) i පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල හා විඥපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමු අදියර සමත්ව තිබීම

හෝ

ii ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමු අදියර සමත්ව තිබීම

(පරිගණක භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.)

04. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය

වැටුප් පරිමාණය : MA 1 - 1-2016 රු. 27,910-10x300-07x350-04495-20x660-48,540/- (මාසික)

(ක. සේ. චක්‍රලේඛ අංක 02/2016 අනුව මෙම වැටුප් ක්‍රමය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, 2017 වර්ෂයේදී ආරම්භක වැටුප රු. 19,234/- ක් හා ගැළපුම් දීමනාව රු. 6,984/-ක් වේ. මීට අමතරව රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.)

වයස : අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි අය විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04.1 කළමනාකරණ සහකාර iii ශ්‍රේණිය (පුරප්පාඩු 02)

සුදුසුකම්

(අ) i සිංහල / දෙමළ භාෂාව

ii ගණිතය

සහ

iii තවත් විෂයයන් දෙක (02) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවරකදී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන ඩිප්ලෝමාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම

හෝ

(ඇ) පරිගණක භාවිතය පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වේ.

වෙනත්

සෑම අපේක්ෂකයෙක්ම,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුයි.

බඳවා ගැනීමේ ක්‍රමය : විවෘත තරග විභාගයකින් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

සේවා කොන්දේසි

1. මෙම තනතුර ස්ථිර වන අතර, අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12% ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා 3% ක් දායක වනු ලැබේ.

රාජකාරි ස්ථානය - කොළඹ

සම්පූර්ණ ජීව දත්ත තොරතුරු තම අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර හා තමා පිළිබඳ තොරතුරු වමසිය හැකි ගැඹින් තොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම සහ ලිපිනයන් ද ඇතුළත් කර අයදුම්පත අදාළ සහතික වල පිටපත් සමග "සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අංක 14, නිදහස් මාවත, කොළඹ - 07" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2017.05.31 දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. අයදුම්පත් එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර තිබිය යුතුය.

රාජ්‍ය/අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතනික ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දත්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

Source: Dinamina, Daily News (2017.05.17)